# සමරු කලාපය

# 2018 ස්පර්ශනී

## යහපත් මාධ්‍ය සංස්කෘතියක් උදෙසා

## සන්නිවේදන හා මහජන සබඳතා උලෙළ

mass.comm
DEPARTMENT OF MASS COMMUNICATION

ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# වර්තමාන මාධ්‍ය ක්ෂේත්‍රය හා එහි ස්වභාවය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආරියරත්න ඇතුගල

මාධ්‍ය වශයෙන් හඳුන්වන්නේ වර්තමාන සමාජයේ සංස්කෘතිය නිරූපණය කරන රටවල් පාලනය කරනු ලබන සුපිරි බලවේගයි. සංස්කෘතියක් වශයෙන් මාධ්‍ය පිළිඹිබු වූවත් එය පාලනය වන්නේ ලෝකයේ සුපිරි රටවල්වල බලවේගයන් මත සිටයි. ජනමාධ්‍ය මගින් නිර්මාණය කරනු ලබන ප්‍රවෘත්ති, නාට්‍ය ආදිය තුළින් රටවල් පාලනය කිරිමට ප්‍රධාන මෙවලම වශයෙන් භාවිතයට ගැනෙන්නේ මාධ්‍යයි. එලෙස ඔවුන් ඉදිරිපත් කරන කලාව පුද්ගලයාගේ රසවින්දනය බවට ද පත්ව ඇත. මාධ්‍ය මෙම මොහොතේ තේරුම් ගැනීම අපහසු ය. ජනතාව උදෙසා පවතින මාධ්‍ය ජනමාධ්‍ය වුවද ජන යන්නෙහි අර්ථය වර්තමානයේ මාධ්‍ය තුළින් ගිලිහී ඇත. වෙළෙන්දා සහ දේශපාලකයා ජනතාව සූරාකෑමේ ප්‍රතිඵලයක් ලෙස දේශපාලනික බලවේගවලින් පීඩාවට පත් වන ජනතාවක් වර්තමානයේ ජීවත් වෙයි. අපේ රටේ මාධ්‍ය සමාජය මා දකින්නේ එලෙසයි.

ලෝකයේ බොහෝ රටවල මාධ්‍ය සංස්කෘතිය සංවර්ධන උපක්‍රමයක් වශයෙන් භාවිත කරයි. ඒ සඳහා බොහෝ බටහිර රටවල් යොදා ගනු ලබන්නේ රූපවාහිනී මාධ්‍යයයි. මිනිසුන්ගේ චර්යා රටාවන් සමාජය පිළිබඳ විවිධාකාර වු අවබෝධයන් එමගින් ලබා ගනී. විශේෂයෙන්ම මෙය මනෝවිද්‍යාත්මක පදනමකින් ක්‍රියාත්මක වෙයි. සමාජ ප්‍රගමනය සඳහා මේවන විට එවැනි රටවල් රූපවාහිනිය භාවිත කර හමාර ය. රූපවාහිනී මාධ්‍ය ලෝකයේ දියුණු රටවල මේ වන විටත් දියුණු මාධ්‍යක් ලෙස ක්‍රියාත්මක වේ. එයින් මහජන සේවා සංකල්පය වැදගත් වන අතර මහජන සේවා සංකල්පය පදනම් කරගෙන ප්‍රජාවට අවශ්‍ය පරිදි සිය වැඩසටහන් විකාශය කරනු ලබ යි. විශේෂයෙන්ම BBC, CNN වැනි නාලිකා සිය ප්‍රධාන ධාරවේ වැඩසටහන් විකාශය කරන්නේ ඉහත සංකල්පයට අනුගත ව ය. දේශපාලනඥයාට හෝ වෙළෙන්දාට අවශ්‍ය පරිදි ක්‍රියාත්මක නොවන මෙම මාධ්‍ය පවත්වාගෙන යනු ලබන්නේ ජනතාවගේ මුදල්වලිනි. එලෙසම එම රටවල්වල විකල්ප මාධ්‍ය ක්‍රියාත්මක වේ. Discovery, National Geography වැනි නාලිකා ඍජුවම ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වේ. අපේ සමාජවලට සාපේක්ෂ ව රූපවාහිනී මාධ්‍ය තුළ වැදගත් වැඩසටහන් ක්‍රියාත්මක වේ. සමාජ දේශපාලනය පිළිබඳ විවෘත දේශපාලන කතිකාවතක් ගොඩ නඟයි. අප රටවල නාට්‍යමය ස්වරූපයකින් අරුත් සුන් දේශපාලන විකාශයන් මිස ප්‍රජාතන්ත්‍රවාදී අවශ්‍යතා පිළිබිඹු කරන වැඩසටහන් ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාව තුළ රූපවාහිනී මාධ්‍ය ව්‍යාජයක් වුව ද තවමත් ලෝකය තුළ දියුණු රටවල එය යථාර්ථයකි.

සමාජයේ සිදුවන ඇතැම් සංසිද්ධි විෂයෙහි ඍජු වගකිවයුත්තා මාධ්‍ය බව මගේ අදහස නොවේ. සමාජීය සංසිද්ධි විෂයෙහි ඍජුව ම බලපාන්නේ රටක ජාතික ප්‍රතිපත්තීන් සහ පාලන ව්‍යුහයන් ය. රූපවාහිනි මාධ්‍ය තුළ විකාශය වන ඇතැම් ටෙලි නාට්‍ය වැනි වැඩසටහන් සමාජයේ යම් යම් සිද්ධිවලට යම් බලපෑමක් සිදු කළ ද ඒවායෙහි

එකම හේතුව වන්නේ මාධ්‍ය නොවේ. එවිට අවශ්‍ය වන්නේ එම ගැටලුවලට විසඳුම් සෙවීමයි. නමුත් අද සමාජයේ මාධ්‍ය චර්යාව දෙස අවධානය යොමු කරන විට එම ගැටලුවලට විසඳුම් සෙවීමට කිසිදු ප්‍රයත්නයක් නොදරන බව පෙනේ.

රූපවාහිනිය ලංකාවට පැමිණෙන කාලවකවානුව තුළ මෙරටෙහි යහපත් සංස්කෘතියක් දක්නට හැකි විය. මහජන සේවා විකාශන ක්‍රමයක් ලෙස ආරම්භක කාලයේ දී විකාශනයන් සිදු වූ අතර අධ්‍යාපනයට ප්‍රමුඛත්වය ලැබුණි. මූලික වශයෙන් මේ සඳහා කාරණා කිහිපයක් බලපායි. ඒවා නම්, ගොවි ජනතාවගේ සහ ධීවර ජනතාවගේ ඥානය සහ ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සඳහා මෙය භාවිතා කිරීම, විධිමත් සහ අවිධිමත් අධ්‍යාපනික ක්‍රමයක් ලෙස භාවිතා කිරීම, නව ලෝකයේ විද්‍යාත්මක දේවල් ලංකාවට ගෙන්වා ගැනීම ආදිය වේ. ගුවන්විදුලි මාධ්‍යයේ ද එසේම ය. එනම්, ආරම්භක අවධියේ දී අධ්‍යාපනික වැඩසටහන්, ළමා වැඩසටහන්, සංගීත වැඩසටහන් තිබුණි. නමුත් 1990 දශකයෙන් පසුව මෙම තත්ත්වය වෙනස් විය. මේ සියල්ල වෙළඳ ආධිපත්‍යයට නතු වීම හා දේශපාලනඥයින්ගේ අතකොළුවක් බවට පත් විය. මේ වන විට රාජ්‍ය මාධ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය සියල්ල ප්‍රජාතන්ත්‍රවාදී රාමුවෙන් තොරව පෞද්ගලික පටු අරමුණු ඔස්සේ ක්‍රියාත්මක වේ.

කලාව හා රස වින්දනය ඉතාමත් අනුවණ හා අවිඥානික ජන ජීවිතයට බාධා කරන පරාසයක ක්‍රියාත්මක වේ. එය රටක් වශයෙන් ඉතා දුර්ගාමී ලක්ෂණයකි. වර්තමානයේ සන්දේශ පුද්ගලයා මනසට ඥානනය කරනු ලබන්නේ පාසලෙන් හෝ විධිමත් වූ වෙනත් ආකාරයකින් නොවේ. බොහෝ පිරිස් සන්දේශ ඥානනය කරනු ලබන්නේ පාසල් අධ්‍යාපනය තුළින් නොව, ගෙදර දොර තම දෙමාපියන්ගෙන් ලබන අධ්‍යාපන ක්‍රමවේදයක් තුළින් නොව, බොහෝ විට ඔවුන් සෘජුව ම ඥානනය කරනු ලබන්නේ මාධ්‍ය තුළින් ලබාදෙන සන්දේශ වේ. එම සන්දේශ පුද්ගල මනසට විවිධාකාරයෙන් බලපෑම් කරන බව මිනිසා අවබෝධ කරගත යුතුය. ඒ පිළිබඳව අවබෝධයකින් එකී සන්දේශ ග්‍රහණය කරගැනීම තුළින් බොහෝ ගැටලුවලට විසඳුම් ලබාගත හැකිය. රසවින්දන ශක්තිය ඉතා දුර්වල මට්ටමක පැවති සමාජ දේශපාලනික අවබෝධය ඉතාම දුර්වලය. ආදරය, කරුණාව, දයාව වැනි මානවීය ගුණාංග යටපත් වී තිබේ. නමුත් ප්‍රධාන ලෙස මාධ්‍ය භාවිතය තුළ ප්‍රබලව ම සමන්විත වන්නේ ආදරය මුල් කරගත් තේමාවක් වේ. රූපවාහිනී වැඩසටහන් තුළ ගීත කලාව ප්‍රබල වශයෙන් කතාබහ කරනු ලබන්නේ ආදරය ගැනයි. අද වන විට ආදරය සමාජය තුළ නාමික වශයෙන් පමණක් රෝපිත වී තිබේ. සංස්කෘතික අභ්‍යන්තරයේ අනන්‍ය ශික්ෂණ ක්‍රමවේදය තුළ දුර්වලතාවයක් පෙන්නුම් කරයි. එහෙත් යුරෝපීය රටවල්වල ජනතාව මාර්ගයේ ගමන් කරන ආකාරය, එකිනෙකාට ගෞරව කරන ආකාරය, එකිනෙකා සමග සිනා මුසු මුහුණින් කතා කරන ආකාරය ඔවුන්ගේ ශික්ෂණ ක්‍රමවේදය තුළ දක්නට ලැබේ. එහෙත් අද වන විට අප සමාජයේ සමහර පුද්ගලයන් එකිනෙකා සමග ගනුදෙනු කිරීමේදී ඔවුන් එක් වී සුහදශීලී ලීලාවකින් ගත නොකරයි. මෙවැනි ධර්මතාවන් සංස්කෘතිය තුළින් ඉගැන්වීමක් අපට ලැබී නැත.

ඉන්දියානු සහ සොප් ඔපෙරා රැල්ල විසින් අප රටෙහි ටෙලි නාට්‍ය සංස්කෘතිය තුළින් බිහි කරනු ලබන්නේ අධි අමානුෂික ව්‍යාධි ඇති කරනු ලබන ප්‍රේක්ෂකයන් ය. බහුතරයක් ජනතාව එම ටෙලිනාට්‍ය රසවිඳියි. දෛනික ජීවිතය වැඩි කොටසක් ටෙලිනාට්‍ය තුළ උකහා ගෙන තිබුණි. ස්වදේශීය එනම් අපට ම අනන්‍ය වූ ජීවිතයකට නිවැරදි මාර්ගෝපදේශ සපයන හෝ වෘත්තීය මාර්ගෝපදේශ සාදා ගැනීමට හෝ තරුණ පරම්පරාවට අනාගත දැක්මක් හෝ ඔවුන්ට යා යුතු මග පෙන්වා දෙන ක්‍රමවේදයක් නොවේ. මාධ්‍ය ප්‍රගමනයට ද එය භාවිතා නොකරයි. තම තමන්ට තමන්ගේ සීමාවන්වල හිඳ මානසික ව්‍යාධි, නිර්මාණ කිරීම අද වන විට ඇති වී ඇති තත්ත්වයයි. ලාංකේය සමාජය තුළ මාධ්‍ය සහ සංස්කෘතිය තුළ ඇත්තේ යහපැවැත්මක් මෙන්ම මනා වූ ගනුදෙනුවක් ය. එහෙත් ලෝකේ වෙනත් රටවල අපේ සමාජ ක්‍රමය තුළ මෙන් දෛනික ජීවිතයට බලපෑම් නොකරයි. ඔවුන් දෙවන පෙළේ මාධ්‍ය ගණයට රූපවාහිනිය මුළුතැන්ගෙය, නිදනකාමරයට පමණක් සීමා කර තිබේ. එහෙත් අපේ රටවල රූපවාහිනිය විසිත්ත කාමරය තුළ ඥානනය සොයන ප්‍රධාන මෙවලමක් බවට පත්විය. කලාව පිළිබඳ ගැඹුරු අවබෝධයක් නොමැති පරම්පරාවක් නිර්මාණය වී තිබේ.

කලාව සමග ඉදිරියට ගමන් කරන කලාවේ යාවත්කාලීන පරපුරක් නිර්මාණය වී නොමැත. වර්තමානයේ බිහිවන වේදිකා නාට්‍ය හෝ චේවා සිනමාව හෝ චේවා පොදු ප්‍රේක්ෂකයාත් සමග සමීප සිනමාවක් අද නිර්මාණය වී නැත. ගීත කලාව පිළිබඳ සඳහන් කිරීමේදී ඉතාම ඉහළ රූපාවලියක් සහිත ගීතයන්ගේ බිහිවීම තුළ ඇත්තේ යහපත් ප්‍රවණතාවයක් නොවේ. නවමු ලෙස හැසිරීම පිණිස කිසිදු දෙයක් ඉතුරු කර නැත්තේ එලෙසින් ම මයිකල් ජැක්සන්ගේ ගීත කලාව හැදෑරීමෙන් හෝ අපගේ කලාව වර්ධනය කර ගැනීමට හෝ නොසිතයි. ජනප්‍රිය කලාව තුළ එම ලක්ෂණ පවතී.

ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය පිළිබඳ අර්ථ දැක්වීමේදී සාක්ෂරතාවය යනු ලිවීමට හා කියවීමට ඇති හැකියාවයි. එහෙත් අප රටේ සාක්ෂරතාව එතරම් දියුණු මට්ටමක නොපවතී. සිංහල භාෂාව පමණක් භාවිතා කිරීමෙන් සාක්ෂරතාවය ප්‍රමාණවත් නොවේ. බහු සාක්ෂරතාවයක් අද වන විට අත්‍යවශ්‍ය වී ඇත. සාක්ෂරතාවය තිබූ පමණින් දැනුම් හා ප්‍රඥාවන්තව සමාජයේ ජීවත් වීමේ ක්‍රියාවලිය ශක්තිමත් වන්නේ නැත.

**මාධ්‍ය සාක්ෂරතාවය**

මාධ්‍ය සාක්ෂරතාව යන කරුණ පිළිබඳ අවධාරණය කිරීමේදී මාධ්‍ය සාක්ෂරතාවය අතින් ලංකාව එතරම් දියුණු මට්ටමකට පත් වී නැත. පාසල් අධ්‍යාපනය සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය වැනි විෂයන් මෙන්ම පුළුල්ව දියුණු වන මාර්ගයන් ව්‍යාප්තව නැත. සන්නිවේදනයේදී සාක්ෂරතාවයට අද වන විට ප්‍රබල බලපෑමක් ඉටු නොවේ. සාකච්ඡා සම්මුති, වෙනත් සම්මන්ත්‍රණ, පොතපත මාධ්‍ය සාක්ෂරතාවය පිළිබඳ ගැඹුරු අවබෝධයක් අද බිහිවන පරපුරට උරුම වී නැත. මාධ්‍ය තුළින් නිරන්තරයෙන් ලබාදෙන අසත්‍ය පොරොන්දුවලින් අසත්‍ය දැන්වීම්වලින් මුලාවට පත්වන්නේ මේ හේතුවෙනි. මාධ්‍ය සාක්ෂරතාවය අද සමාජයේ ජීවත් වන සැමට ම අත්‍යවශ්‍ය වන්නකි. එය නිරුත්සාහයෙන් වර්ධනය නොවේ. එය අත්දැකීම් පරිචය තුළින් වර්ධනය කර ගැනීමෙන් සාක්ෂරතාවය නංවා ගත හැක. මාධ්‍ය සාක්ෂරතාවයේ සීමා අද වන විට පුළුල් ව ව්‍යාප්ත ව ඇත. තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව, දේශපාලන සාක්ෂරතාව, සංඥාර්ථවේදී සාක්ෂරතාව, සමාජ සවිඥානික සාක්ෂරතාව යන වර්ගීකරණ මෙම සීමාවේ විශාලනයන් ලෙස සඳහන් කළ හැකිය. ලංකාව සාක්ෂරතාව අතින් අවම රටකි. සාක්ෂරතාවය වර්ධනය වන්නේ අධ්‍යාපනය සහ අවබෝධය ලබාගැනීම තුළිනි. සමාජයේ ඇතැම් ස්ථානවලදී සාක්ෂරතාව පිළිබඳව සඳහන් කිරීමේදී මිනිසුන් මාධ්‍ය සමග නොගැවසෙයි. එහෙත් පරිගණකය සහ නවීන ජංගම දුරකතන තාක්ෂණය සමඟ පුළුල් ළබැඳියාවක් අත්පත් කරගෙන සිටී. දේශීය සම්පත් සමඟ පමණක් ගනුදෙනු කරන පිරිසට සාක්ෂරතාව පිළිබඳ ඇත්තේ පටු දෘෂ්ටිවාදයක් පමණි. විදේශීය සම්පත් භාවිත කරන පිරිසට සාක්ෂරතාව පිළිබඳව ඇත්තේ පුළුල් දැක්මකි.

උදාහරණයක් වශයෙන් ගතහොත් කොකා කෝලා, කිරිපිටි වර්ගවල වර්ණය යොදාගැනීම පිළිබඳව අනවබෝධයෙන් මිනිසා එම ද්‍රව්‍ය පරිභෝජනයට පුරුදු වී සිටීම දැක්විය හැකි ය. මෙම සෑම දෙයක ම ආර්ථික, සංස්කෘතික, මනෝවිද්‍යාත්මක සංයුතියක් සමඟ ගොඩනැඟී ඇත. මේ සමඟ ම සාක්ෂරතාව ගොඩනැගේ. මිනිසාට මාධ්‍ය සන්දේශ අවබෝධ කරගැනීමේදී ඒ පිළිබඳව ඇති ඥානය අවම මට්ටමක පවතී. එයින් අදහස් වන්නේ මිනිසා එම ද්‍රව්‍ය පරිභෝජනයට යොමු වී සිටින්නේ මාධ්‍ය පිළිබඳ ව අනවබෝධයෙන් වන බවයි. ශ්‍රී ලංකාව තවමත් සැලකෙන්නේ නොදියුණු ජාතියක් ලෙස ය. අධ්‍යාපන ක්‍රමය නවීකරණය කිරීම මඟින් මිනිසාගේ සාක්ෂරතාවය වර්ධනය කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීමට කාලය එළඹ ඇත. සෑම මිනිසෙකු තුළ ම මාධ්‍ය සන්දේශ නිසි පරිදි ග්‍රහණය කරගැනීමට අවශ්‍ය ඥානය වර්ධනය කිරීම සිදු කළ යුතු ය. ජාතියක් වශයෙන් දියුණු තත්ත්වයකට පත්වීමට නම් හැකි ඉක්මනින් මාධ්‍ය සාක්ෂරතාව මිනිසුන් තුළ ඇති කළ යුතු ය. ඒ සඳහා වගකිව යුතු සියලු පාර්ශ්ව වගකීමෙන් යුතුව කටයුතු කිරීම වැදගත් වේ.